- **ආදරණීය දුවේ පුතේ,**
- පහත ඡේද හොඳින් කියවන්න.

**සීයා අඹ පැළයක් ගෙනාවේ ය. තාත්තා නිවස ඉදිරිපිට වළක් කැපුවේ ය. අයියා පොහොර ගෙනාවේ ය. අම්මා පස් හා පොහොර යොදා පැළය සිටවූවා ය. මම පැළයට වතුර දැමුවෙමි. නංගීගේ උපන්දිනයට අපි අඹ පැළයක් සිටවූවෙමු.**

**තාරක ඉරටු කැපුවේ ය. මාලක ඉරටු එකට තබා ගැට ගැසුවේ ය. සාරති පාප්ප සාදා දුන්නා ය. අම්මා සව්කොළ ගෙනවිත් දුන්නා ය. යහළුවෝ එක් වී සරුංගලයක් හැදුවෝ ය. අම්මා රැලි කපා දුන්නා ය. තාරක සරුංගලයට රැලි එල්ලුවේ ය. යහළුවෝ එක් වී සරුංගලය වත්ත පහළට ගෙන ගියහ. මාලක සරුංගලය සුළඟේ පා කළේ ය.**

- ඕනෑම වාක්‍යයක උක්තය ආඛ්‍යාතය හා කර්මය යන ප්‍රධාන අංග තුනකින් යුක්තය.
- අද අප ඉගෙන ගන්නේ වාක්‍යයක කර්මය යන අංගයයි.

**'සීයා කුඹුර කොටයි'** යන වාක්‍ය ගත්විට

එම වාක්‍යයේ 'සීයා' කොටනනේ කුමක්ද ?' 'කුඹුර' යන්න ඊට පිළිතුර යි.

ඒ අනුව එම වාක්‍යයේ 'කර්මය' වන්නේ 'කුඹුර' යන්න යි.

- **මෙම අනුව පහත ඡේදවල කර්මය සොයා ලියන්න.**

1)සීයා අඹ පැළයක් ගෙනාවේ ය. -..........................................................................

2)තාත්තා නිවස ඉදිරිපිට වළක් කැපුවේ ය. -............................................................

3)අයියා පොහොර ගෙනාවේ ය. -......................................................................

4)අම්මා පස් හා පොහොර යොදා පැළය සිටවූවා ය.-................................................

5)මම පැළයට වතුර දැමුවෙමි. -..........................................................................

6)අඹ පැළයක් සිටවූවෙමු. -...........................................................................

7)තාරක ඉරටු කැපුවේ ය. -..........................................................................

8)මාලක ඉරටු එකට තබා ගැට ගැසුවේ ය. -.................................................

9)සාරති පාප්ප සාදා දුන්නා ය. -.................................................................

10)අම්මා සව්කොළ ගෙනවිත් දුන්නා ය. -..............................................................

11)යහළුවෝ එක් වී සරුංගලයක් හැදුවෝ ය. -..............................................................

12)අම්මා රැලි කපා දුන්නා ය. -..................................................................

13)තාරක සරුංගලයට රැලි එල්ලුවේ ය. -.................................................................

14)තාරක සරුංගලයට රැලි එල්ලුවේ ය. -.........................................................................

15) මාලක සරුංගලය සුළඟේ පා කළේ ය. -.............................................................................